# <u>දකුණු පළාත් සභාවේ පළාත් අරමුදල් ගිණුම සකස් කිරීම.</u>
# <u>ආකෘතිපත්‍ර හා උපදෙස්.</u>

## <u>දේපළ, පිරියත උපකරණ ගිණුම්ගත කිරීම.</u>

දේපල පිරියත සහ උපකරණ, ඉඩම්, මෙහෙයුම් ගොඩනැගිලි, යන්ත්‍ර, මෝටර් රථ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, කාර්යාල උපකරණ, පුස්තකාල පොත් සහ පරිගණක මෘදුකාංගවලින් සමන්විත වේ.

දකුණු පළාත් සභාවේ දේපළ පිරියත හා උපකරණවලට අයත් සියළු වත්කම් අවසන් ගිණුමට ඇතුළත් කර ඇති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව ක්ෂය කර ඇත.

වත්කම්වල ආර්ථික ඵලදායී ජීවිත කාලය පුරා සියළු දේපල පිරියත සහ උපකරණ වල **ඇස්තමේන්තුගත අවශේෂිත වටිනාකම් අඩු කර ක්ෂය අනුපාතයන්ට හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර ස්ථාවර වත්කම් ඉවත් කරන වර්ෂයේ ක්ෂය කරනු නොලැබේ**. ප්‍රධාන වත්කම් පන්ති වල ඵලදායී ජීවිත කාලය මත ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

| වත්කම් | වාර්ෂික ක්ෂය කිරීම % |
|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි | 2 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 12.5 |
| මෝටර් වාහන | 10 |
| ගෘහභාණ්ඩ හා සවි කිරීම් | 10 |
| කාර්යාල උපකරණ හා පරිගණක | 25 |
| පුස්තකාල පොත් | 25 |
| පරිගණක මෘදුකාංග | 25 |

ස්ථාවර වත්කම් පහත ආකෘතීන් උපයෝගී කරගෙන පළාත් භාණ්ඩාගාරයට වාර්තා කිරීම කළ යුතුය.